# ශ්‍රී ලංකාවේ ජාතික පාසල්වල මානව සම්පත් කළමනාකරණයේ ස්වභාවය හා එය වඩා ඵලදායී කරගත හැකි නව ප්‍රවණතා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

(වයඹ පළාතේ ජාතික පාසල් ඇසුරෙනි)


ඒ.එම්.එස්.වෙදමුල්ල

ශාස්ත්‍රවේදී

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන)

අධ්‍යාපනපති,

ලි.ප. අංකය 94/M.phil/39


කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති උපාධි පාඨමාලාවේ අවශ්‍යතා පූර්ණය සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයකි.

1995/1997 වර්ෂය


UCLIB
504717



අධ්‍යාපන පීඨය,

කොළඹ විශ්ව විද්‍යාලය,

කොළඹ


2001.04.30


University of Colombo Library Sri Lanka

සංක්ෂේපයෙන් ---------

අධ්‍යාපන ප්‍රතිපත්ති කොතරම් අගයන ඒවා වුවත් කොතරම් හොඳින් සැලසුම් කළත් අවසාන වශයෙන් ඒවා ක්‍රියාත්මක වන පාසල තුළ ඒවා සාර්ථක ලෙස ක්‍රියාත්මක නොවුන හොත් ඉන් බලාපොරොත්තු වන පරමාර්ථ ඉටු නොවිය හැක. මෙරට අධ්‍යාපන පර්යේෂකයන් වෙත ඉදිරිපත්වී ඇති මූලික අභියෝගය වන්නේ ශ්‍රී ලංකාවේ පාසල් වල පොදු කළමනාකරණ ගැටළු හඳුනාගෙන ඒවාට සුදුසු විසඳුම් මෙරටට ගැලපෙන ආකාරයට නිර්මාණය කර ගැනීමයි.

ප්‍රමාණාත්මක වශයෙන් ව්‍යාප්ත වන අධ්‍යාපනික ඉඩ ප්‍රස්ථා තුළින් ගුනාත්මක වශයෙන් පුළුල් සංවර්ධනයක් ඇති නොවන්නේ මන්දැයි විමසා බැලිය යුතුය.

පසුගිය දශක 4 ක පමණ කාලය තුළ පාසල් කළමනාකරුවන්ට ඒ සඳහා අවශ්‍යය කුසලතා ලබා නොදීමෙන් පාසල් පද්ධතියෙන් අපේක්ෂිත ගුණාත්මක වර්ධනයක් සිදු නොවීයයි විවේචන එල්ල වෙමින් පවතී.

එනිසා සෑම පාසලක්ම ඒවාට අවේනික වූ ඉලක්ක සපුරා ගත යුතුව ඇත. මේ සඳහා පාසල් සංවිතය තුළ අධ්‍යාපන කළමනාකරණ ක්‍රියාවලිය අතිශයින් වැදගත් ක්‍රියාවලියක් බවට පත්වී තිබේ.

දැනට ශ්‍රී ලංකාව පුරා ශීඝ්‍රයෙන් ජාතික පාසල් රාශියක් බිහිවන මෙම වකවානුවෙහි විධිමත් කළමනාකරණය හා මනා සංවිධානය තුළින් අපේක්ෂිත ජාතික අරමුණු මෙම පාසල් තුළින් ඉටුවේද? ඒ තුළ සිටින ප්‍රජාවට මුහුණ දීමට සිදුවී ඇති ගැටලු හා එය වඩා ඵලදායී කරගත හැකි නව ප්‍රවණතා කවරේදැයි විමසා බැලීම කාලෝචිත අවශ්‍යතාවයකි. ඒ නිසා පර්යේෂකයා විසින් ජාතික පාසල් වල මානව සම්පත් කළමනාකරණයේ ස්වභාවය හා එය වඩා ඵලදායී කර ගත හැකි නව ප්‍රවණතා පිළිබඳව විමසා බැලීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය.

ශ්‍රී ලංකාවේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ මෙතෙක් විධිමත් අධ්‍යයනයක් කර නැති නිසා මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයට එලදායී මෙහෙවරක් කළ හැකි වේ යයි අපේක්ෂා කෙරේ.

නිබන්ධනයේ පළමුවැනි පරිච්ඡේදයෙන් පර්යේෂණයට මුල්වූ ගැටලුව හඳුන්වා දී දෙවැනි පරිච්ඡේදයෙන් අදාල පර්යේෂණ සාහිත්‍යය විමර්ශනය කරන ලදී.

තුන් වන පරිච්ඡේදයෙන් අධ්‍යයනයේ ක්‍රම පිළිවෙත විස්තර කරන ලදී. විධිමත් පාසල් පද්ධතියෙන් ජාතික පාසල් විශේෂ කර දැක්වීමට හේතු සහ එහි අරමුණු පිළිබඳව විග්‍රහ කර බැලීම, ජාතික පාසල් වලට මානව සම්පත් සැලයීමේ පදනම, ප්‍රතිපත්ති සොයා බැලීම, අධ්‍යාපන සංවර්ධන සැලසුම්කරණයේදී හා ක්‍රියාවලියේදී මානව සම්පත් කළමනාකරණය කෙසේ සිදුවී ඇත්ද යන්න විමර්ශනය කිරීම හා ජාතික පාසල් වල මානව සම්පත් කළමනාකරණය වඩා එලදායී කර ගත හැකි නව ප්‍රවණතා ඉදිරිපත් කිරීම ඉදිරි පරිච්ඡෙද වල කාර්යය විය.

මෙම පර්යේෂණය ක්‍රියාත්මක කරන ලද්දේ වයඹ පළාතේ අහඹු ලෙස තෝරා ගන්නා ලද ජාතික පාසල් දහයක් ඇසුරෙනි. 1AB, 1C යන ජාතික පාසැල් වලින් ගුරුවරුන් 250 දෙනෙකු සහ විදුහල්පතිවරුන් දස දෙනෙකුද, අමාත්‍යාංශ නිලධාරීන් 4 දෙනෙකුද ඇතුළුව නියැදියට අයත් මුළු සංඛ්‍යාව 264 ක් විය. විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් ප්‍රශ්නාවලි මගින්ද, විදුහල්පතිවරුන්, අමාත්‍යාංශ නිලධාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙන්ද, තෝරා ගන්නා ලද පාසල් 4ක් නිරීක්ෂණය කිරීමෙන්ද දත්ත රැස්කරගන්නා ලදී. විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය මෙහිදී අනුගමනය කර ඇත.

සිව් වැනි පරිච්ඡේදය යොදාගනු ලැබුවේ දත්ත විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීම සඳහාය. විදුහල්පතිවරුන්ගෙන්, ගුරුවරුන්ගෙන්, අමාත්‍යාංශ නිලධාරීන්ගෙන් ලබාගත් දත්ත පාසල් වර්ගීකරණය අනුව විශ්ලේෂණය කරන ලදී. මෙහිදී ප්‍රධාන වශයෙන් ප්‍රතිශත ක්‍රමය උපයෝගී කර ගන්නා ලද අතර වගු අවශ්‍යතන්හි යොදා ගැනිණි.

ජාතික පාසල් වල සැලසුම්කරණය හා සංවිධානය සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය හා පළාත්සභා අතර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විවිධ ගැටලු පැනනැගී ඇති බවද, එය පාසල් කළමනාකරණය කෙරෙහි බලපා ඇති බවද, ජාතික පාසල් පිහිටුවීමේදී අදාල නිර්ණායක අනුගමනය කර නැති බවද, පාසල් වර්ගීකරණය අනුව මානව සම්පත් කළමනාකරණයේදී විධිමත් ලෙස කාර්ය පැවරීමක් නොවී ඇති අතර යම් විෂමතා ඇති බවද, අනාවරණය විය.

ජාතික පාසල් වල ගුරුවරුන් බෙදා හැරීමේ අසමානතාවක් දක්නට ලැබෙන අතර ඒ සඳහා නිශ්චිත ප්‍රතිපත්තික් අනුගමනය නොකෙරේ. පාසල් කළමනාකරණය තුළ නියෝජ්‍ය විදුහල්පති, අංශ ප්‍රධාන භූමිකාවන්හි අපේක්ෂිත අරමුණු හෝ එම භූමිකාවන්ට පද්ධතිය තුළ හිමිවන වගකීම්, බලතල පිළිබඳ පැහැදිලි නිශ්චිතවූ ක්‍රමයක් ජාතික මට්ටමින් විද්‍යාමාන නොවේ. සම්පත් කළමනාකරණයේදී ක්‍රමවත් අධීක්ෂණ ක්‍රමයක් ජාකිත පාසල් තුළ ක්‍රියාත්මක කළයුතු බවට යෝජනා කෙරේ.

ජාතික පාසල් වල මානව සම්පත් කළමනාකරණය වඩා ඵලදායී කර ගැනීම සඳහා "පාසල් පාදක කළමනාකරණය" නව ප්‍රවණතාවක් ලෙස ඉදිරිපත් කරන අතර "පාසල් කළමනාකරණ මණ්ඩල" ද යෝජනා කෙරේ.

විදුහල්පතිවරුන් නඩත්තු කළමනාකරුවන් ලෙස නොව අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කරනු සඳහා සංවර්ධන කළමණාකරුවන් වශයෙන් කටයුතු කිරීම පාසල තුළ "සහභාගී කළමනාකරණ ක්‍රියාවලිය" වර්ධනය කර ගැනීම හා ගුරු සංවර්ධන වැඩ සටහන් පාසල් පාදක ගැටලු පදනම් කරගෙන ආරම්භ කිරීම වැනි ප්‍රවණතා කිහිපයක් පර්යේෂණය අවසානයේදී ඉදිරිපත් කිරීමට හැකිවිය. එසේම අනාගතයේදී පර්යේෂණයට භාජනය විය යුතු ක්ෂේත්‍ර කීපයක් හඳුනාගැනීමට අවස්ථාව උදාවිය. දැනට ශ්‍රී ලංකාව පුරා ශීඝ්‍රයෙන් බිහිවී ඇති ජාතික පාසල් වලින් අපේක්ෂිත අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා පාසල් කළමනාකරණය තුළ මානව සම්පත් මනා සේ හසුරුවා ගැනීමෙන් එය මනා ලෙස කාර්යක්ෂමව යොදා ගැනීමටත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු සැලසුම්කරුවන්ගේ අවධානය යොමු කිරීම සඳහා මෙම පර්යේෂණයෙන් හෙළිකරන ලද තොරතුරු ඵලදායී ලෙස දායක වේ යයි අපේක්ෂා කෙරේ.

University of Colombo Library Sri Lanka